
# රොබී



දෙව්නි සෙනුල්යා ඒකනායක

# රොබී

දෙව්නි සෙනුල්‍යා ඒකනායක
කතෘ

## කර්තෘගේ වෙනත් කෘති

- මොලී

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

හතර ශ්‍රේණිය

2025 02 08

ISBN 978-624-208-803-7

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි  ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ  ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම  සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිම්පානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

එකමත් එක කාලෙක රොබී කියලා මාළුවෙක් හිටියා. එයා හරිම ලස්සනයි. ඒත් එයා අනික් මාළුවන්ට වඩා ටිකක් පුංචියි.



රොබීට යාළුවෙක් හිටියා. එයාගෙ නම ජිමී. ජිමී නම් රොබීට වඩා ලොකුයි. මේ දෙන්නා හරිම සතුටින් ජීවත් වුණා.



රොබීට හිටියා නංගි කෙනෙක්. එයාගෙ නංගිත් එයාට වඩා ලොකුයි. රොබී ඒ ගැන හිටියේ හරිම දුකෙන්.



හැබැයි ජිමී නම් රොබීට කවදාවත් පොඩි කියල විහිළු කළේ නෑ.
රොබීට ජිමී ඇරෙන්න වෙන යාලුවෙක් හිටියෙත් නෑ.



ඒත් මුහුදේ ඉන්න අනිත් මාළු රොබී පුංචියි කියලා හැමදාම විහිළු කළා. රොබී ඒ ගැන හරිම දුකෙන් තමයි හිටියේ.



එක දවසක් රොබී පීන පීන ඉද්දී ලොකු මාළු ගොඩක් ඇවිත් රොබී වටකර ගත්තා. ඊට පස්සේ එයාට හොඳටම විහිළු කළා. රොබී අඬ අඬා ගෙදර ගියා.



රොබී එයාගේ කාමරයට ගිහින් මේ ගැන කල්පනා කළා. රොබී ලොකු වෙන්න බෙහෙතක් හදන්න පටන් ගත්තා.එයා හදපු බෙහෙත බිව්වා. හැබැයි මුකුත් වුණේ නෑ රොබී දුකින්ම නිදාගත්තා.



උදේ නැගිට්ද්දී හරිම පුදුම වැඩක් තමයි වෙලා තිබුණේ. රොබී හොඳටම ලොකුවෙලා අනික් මාළු හැමෝම රොබීට බයේ දුවනවා. කවුරුත් ළඟට ආවේ නෑ.



අනේ රොබී දැන් මොකද කරන්නේ කියලා කල්පනා කළා. ආයෙත් ගෙදර ඇවිත් අලුත් බෙහෙතක් හැදුවා. එදත් ඒක බීලා නිදාගත්තා.



පහුවදා උදේ නැගිටිනකොට රොබී හිටියටත් වඩා පුංචි වෙලා දැන් රොබීට කිසිම දෙයක් කරගන්න විදිහක් නෑ.



පිමී එතැනට ආවා. රොබීට උදව් කළා. කොහොම හරි රොබී හිටිය විදියටම ආයෙත් ආවා.



ඊට පස්සේ රොබීට හිතුණා කවුරු මොනවා කිව්වත් කමක් නැහැ. මම ඉන්න විදියට තමයි හොඳ කියලා.



එදා ඉඳන් රොබී හැමදාම සතුටින් හිනා වෙලා හිටියා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබු භාග්‍යයකි එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරුපසක් සැකසීම සමාජ වගකීමයි

පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය දියණියන් ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්

වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණීය යුගයේ ස්මාට් බාල පරම්පරාව නුතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි තම නිර්මාන ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-803-7